# ජාතික ආදායම හා වියදම

## සමස්ත උපනතීන්

1983 දී ශ්‍රී ලංකාවේ ඇතිවුණු සිවිල් අරගලකාරී තත්ත්වයට පෙර තිබුණු ආර්ථික වර්ධනයෙහි විශේෂිත ලක්ෂණ නැවත පෙන්නුම් කරමින් 1990 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ පුනර්ජීවනයක් සමඟ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. දළ ජාතික නිෂ්පාදිතය මූර්ත වශයෙන් සියයට 6.6 ක වේගයෙන් වර්ධනය වූ අතර, 1989 දී වර්ධන වේගය වූයේ සියයට 2.3 කි. මෙය 1985–1989 පස් අවුරුදු කාලය තුළ අත්කර ගත් වාර්ෂික සාමාන්‍යය දළ ජාතික නිෂ්පාදිතය වර්ධනය වූ සියයට 2.7 ට වඩා බෙහෙවින් සැළකිය යුතු වර්ධනයක් ලෙස හැඳින්විය හැකිය..

1990 වසරේදී ආර්ථිකයේ සෑම අංශයන්හිම වර්ධනයක් පෙන්වූ අතර, කෘෂිකාර්මික අංශයෙහි වූ සැළකිය යුතු ප්‍රගතිය ඉහත කී වර්ධන වේගය ලබාගැනීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. යහපත් කාලගුණික තත්ත්වය හා රටේ බොහෝ පෙදෙස් වල සාමකාමී තත්ත්වයක් ඇතිවීම, දළ ජාතික නිෂ්පාදිතයෙන් ¼ කට පමණ හිමිකම් කියනු ලබන කෘෂි අංශයෙහි නව පිබිදීමකට හේතු විය. වන කර්මාන්ත හා ධීවර කර්මාන්තය ඇතුළත්ව කෘෂි අංශයෙහි නිෂ්පාදන පරිමාව 1990 වසරේදී සියයට 8.8 ක වර්ධනයක් ලබාගත් බව ඇස්තමේන්තු කර ඇත. මෙය මුළු දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධනයට සියයට 31 කින් දායක වීමකි. පසුගිය වසර කිහිපය තුළදී වර්ධන උපනතියක් පෙන්වූ කාර්මික අංශය තවදුරටත් එම වර්ධනයම, 1990 වර්ෂයේදී ද පවත්වාගෙන යන ලදී. කාර්මික අංශයෙහි වර්ධනය 1990 දී සියයට 9.4 කින් වර්ධනය වූ බව ඇස්තමේන්තු කර ඇති අතර, ඒ සඳහා කාර්මික අපනයනයන්ගේ ඉහළ යෑම මූලික වී ඇත. කාර්මික අංශයෙන් දළ ජාතික නිෂ්පාදිතයෙහි වර්ධනයට වූ දායකත්වය සියයට 25 කි.

වර්ධනයට දායක වූ අනෙකුත් අංශ අතර, 1989 වසරේදී නිෂ්පාදනය සියයට 5.4 කින් වැඩි වූ බව ඇස්තමේන්තු කර ඇති පතල් හා කැනීම් අංශය 1990 දී සියයට 9.1 ක් වූ වඩාත් සතුටුදායක වර්ධන වේගයක් වාර්තා කළේය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ මැණික් ගැරීම් උප අංශයෙහි වූ වර්ධනයයි. රටේ ආරක්ෂක තත්ත්වයේ ඇති වූ යහපත් වාතාවරණය නිසා 1990 දී ඉදිකිරීම් අංශයෙහි ක්‍රියාකාරකම් වැඩි දියුණු වූ අතර, එය එම අංශයෙහි කලින් වසරේ පැවැති වර්ධන වේගයට වඩා වැඩි වර්ධන වේගයක් පෙන්නුම් කළේය.

වෙළෙඳ, ප්‍රවාහන, බැංකු කටයුතු වල වර්ධනය හා සංචාරක සේවා අංශයෙහි පුළුල් වීම, සේවා අංශයෙහි වැඩි වර්ධන අනුපාතයකට හේතු වූ අතර, 1989 දී සියයට 3.2 ක් වූ වර්ධනය 1990 දී සියයට 4.3 ක් විය.

1990 දී පවත්නා සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 285 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1989 වර්ෂයට වඩා සියයට 27.9 ක වැඩිවීමක් නියෝජනය කරයි. මේ අතර, ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම මැනීම සඳහා භාවිතා කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය, වසර තුළදී ඇතිවූ මිළ මට්ටමේ අධික ඉහළ නැඟීම පිළිබිඹු කරමින් 1990 දී සියයට 20 ක අනුපාතිකයකින් වැඩි වූ අතර, පසුගිය වසරෙහි එය සියයට 9.7 ක් විය. 1982 ස්ථාවර සාධක මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය රුපියල් බිලියන 127 ක් වූ අතර, එය 1989 ට වඩා සියයට 6.6 ක වැඩිවීමකි. මේ අතර දළ දේශීය නිෂ්පාදිතය හෙවත් දළ ජාතික නිෂ්පාදිතයෙන් විදේශීය ශුද්ධ සාධක ආදායම අඩු කළ විට මූර්ත වශයෙන් සියයට 6.2ක වර්ධනයක් වාර්තා කළේය. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සමඟ සැසඳීමේදී දළ ජාතික නිෂ්පාදිතයේ ඉහළ වර්ධන අනුපාතයට, රටේ විදේශ වත්කම් වැඩිවීම හේතුවෙන් රට තුළට ගලා ආ සාධක ආදායම් ඉහළ යාම බලපා ඇත.

තාවකාලික ඇස්තමේන්තු වලට අනුව, 1990 දී ශ්‍රී ලංකාවේ ජනගහණය දශ ලක්ෂ 17.0 ක් විය. මෙය 1989 ට වඩා සියයට 1.1 කින් වැඩිවීමකි. මෙයට අනුකූලව පවත්නා මිළ ගණන් අනුව වූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය, 1990 දී රුපියල් 16,745 (එ. ජ. ඩොලර් 418)

වී යැයි ඇස්තමේන්තු කර ඇත. පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල ආදායම 1990 දී සියයට 26.0 කින් වර්ධනය වුවද, මූර්ත වශයෙන් සලකා බලන කල වැඩි වී ඇත්තේ සියයට 5.4 කින් පමණි.

මූර්ත ජාතික ආදායමේ වර්ධනය පරීක්ෂා කර බැලීමේදී, වෙළෙඳ අනුපාතයට සිදුවූ වෙනස්වීම් සලකා බැලෙන අතර, අපනයන වලින් ආවරණය වන ආනයන ධාරිතාවයද සලකා බැලේ. 1990 දී වෙළෙඳ අනුපාතය සියයට 10 කින් පහත වැටුණි. එම නිසා මූර්ත ජාතික ආදායම මූර්ත දළ ජාතික නිෂ්පාදනය සමඟ සසඳන විට (දළ ජාතික නිෂ්පාදිතය වෙළෙඳ අනුපාතය සමඟ ගැලපූ පසු) අඩු වර්ධනයක් (සියයට 3.4) පෙන්නුම් කළේය.

වියදම් අංශයෙන් බැලූ විට, පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 346 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 1989 ට වඩා සියයට 25.5 ක වැඩිවීමකි. 1990 දී පරිභෝජන වියදමේ නාමික අගය සියයට 23.7 කින් ඉහළ ගිය අතර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 73 ක් බවට ඇස්තමේන්තු කරන ලදී. 1989 සමඟ සසඳන විට එහි ඉහළ නැඟීම සියයට 32.7 කි.

1990 දී පෞද්ගලික පරිභෝජන වියදමෙහි මූර්ත අගය සියයට 2.7 කින් ඉහළ ගිය අතර එහි 1989 වර්ධනය සියයට 1.0 කි. මේ අතර රජයේ පරිභෝජන වියදම ආන්තික වශයෙන් පහත වැටුනු බව දක්නට ඇත. සමස්ත පරිභෝජන වියදමෙහි ඉහළ යාම මූර්ත වශයෙන් සියයට 2.1 කි.

දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ආයෝජනය ගත් කල 1989 දී එය සියයට 21.7 ක් වූ අතර, 1990 දී මෙම අනුපාතය සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් සියයට 22.6 ක් දක්වා ඉහළ ගියේය. 1990 දී ආයෝජනයේ ව්‍යුහාත්මක වෙනස්වීමක් පෙන්නුම් කරමින් පෞද්ගලික අංශයෙහි ආයෝජනය ප්‍රමුඛතාවයක් ගත් අතර රාජ්‍ය අංශයෙහි ආයෝජනයේ පහළ වැටීමක් දක්නට ලැබේ. මෙම උපනතියට අමතරව 1990 දී රජයේ ආයෝජනයන් ප්‍රමුඛතා අංශ කෙරෙහි ඒකරාශී වීමක් දක්නට ලැබෙන අතර එම ආයෝජනයන් ආර්ථික හා සමාජයීය පාදක ව්‍යුහමය අංශ කෙරෙහි යොමු වී ඇති බව පෙනේ.

දේශීය ඉතුරුම් රුපියල් බිලියන 47 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 14.8 ක් විය. මේ අතර 1989 දී සියයට 14.6 කින් ඉහළ ගිය ජාතික ඉතුරුම් අනුපාතය රට තුළට ගලා ආ සාධක ආදායම් හා පෞද්ගලික ප්‍රේෂණයන්ගේ බලපෑම නිසා 1990 දී සියයට 17.5 ක වර්ධනයක් පෙන්නුම් කළේය.

**ආංශික ක්‍රියාකාරිත්වය**

දළ ජාතික නිෂ්පාදිතයේ ආංශික සංයුතිය හා 1982 වර්ෂයේ ස්ථාවර මිළ පදනම් කරගත් එකතු කළ අගයෙහි දක්නා ලද වෙනස්වීම් 1.6 වගුවෙහි දක්වා ඇත. 1990 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයෙහි සියයට 8.8 ක් වූ වර්ධන වේගයක් වාර්තා විය. රට තුළ පැවති නොයන්සුන් වාතාවරණය හා අහිතකර දේශගුණික තත්ත්වයේ අයහපත් බලපෑම් වලට ලක්වූ කෘෂිකාර්මික අංශය ඉකුත් වසරේදී සියයට 1.1 කින් පහත වැටී තිබුණි.

වැවිලි කර්මාන්ත අංශයෙහි ප්‍රධාන උප අංශයක් වූ තේ කර්මාන්තයේ සිත්ගන්නා සුළු ක්‍රියාකාරිත්වයක් දක්නට විය. 1990 වර්ෂයේදී තේ නිෂ්පාදනය මෙතෙක් වාර්තාගත වැඩිම නිෂ්පාදන මට්ටම ඉක්මවා ගිය අතර, මෙම අංශයෙහි එකතු කළ අගයේ වැඩිවීම 1989 වර්ෂය හා සසඳනවිට සියයට 12.6 දක්වා ඉහළ නැඟ තිබුණි. මේ අතර රබර් හා පොල් උප අංශ පිළිවෙලින් සියයට 3 ක හා 1.6 ක එකතු කළ අගයෙහි වැඩිවීමක් අත්කර ගැනීමට සමත් විය.

## 1.6 සංඛ්‍යා සටහන

### ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයේ ආංශීය සංයුතිය සහ වර්ධනය 1988—1990

| අංශ | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | ද. ජා. නි. හි. ප්‍රතිශතයක් වශයෙන් | | | පසුගිය වසරට වඩා වැඩිවීම (රුපියල් දශ ලක්ෂ) | | ද. ජා. නි. වැඩිවීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1988 | 1989 | 1990 | 1988 | 1989 | 1990 | 1989 | 1990 | 1989 | 1990 |
| 1· කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය .. | 27,984 | 27,666 | 30,100 | 24·1 | 23·3 | 23·7 | – 318 | 2,434 | – 12·0 | 30·9 |
| 1·1 කෘෂිකර්මය .. | 23,762 | 23,311 | 25,818 | 20·4 | 19·6 | 20·4 | – 451 | 2,707 | – 17·0 | 34·4 |
| 1·1·1 තේ .. | 2,926 | 2,668 | 3,004 | 2·5 | 2·2 | 2·4 | – 258 | 336 | – 9·7 | 4·3 |
| 1·1·2 රබර් .. | 770 | 697 | 718 | 0·7 | 0·6 | 0·6 | – 73 | 21 | – 2·7 | 0·3 |
| 1·1·3 පොල් .. | 2,501 | 3,210 | 3,261 | 2·1 | 2·7 | 2·6 | 709 | 51 | 26·7 | 0·6 |
| 1·1·4 වී .. | 6,312 | 5,258 | 6,467 | 5·4 | 4·4 | 5·1 | – 1,054 | 1,209 | – 39·6 | 15·4 |
| 1·1·5 අනෙකුත් .. | 11,253 | 11,478 | 12,368 | 9·7 | 9·7 | 9·8 | 225 | 890 | 8·5 | 11·3 |
| 1·2 දව ආදී වන ද්‍රව්‍ය .. | 1,943 | 1,985 | 2,030 | 1·7 | 1·7 | 1·6 | 42 | 45 | 1·6 | 0·6 |
| 1·3 ධීවර .. | 2,279 | 2,370 | 2,252 | 2·0 | 2·0 | 1·8 | 91 | – 118 | 3·4 | – 1·5 |
| 2· පතල් හා කැනීම් කටයුතු .. | 3,392 | 3,576 | 3,901 | 2·9 | 3·0 | 3·1 | 184 | 325 | 6·9 | 4·1 |
| 3· නිමැවුම් කර්මාන්ත .. | 19,622 | 20,488 | 22,427 | 16·9 | 17·2 | 17·7 | 866 | 1,939 | 32·6 | 24·6 |
| 3·1 අපනයන සැකසීම .. | 3,273 | 3,257 | 3,530 | 2·8 | 2·7 | 2·8 | – 16 | 273 | – 0·6 | 3·5 |
| 3·2 නිෂ්පාදන කර්මාන්ත .. | 14,030 | 15,500 | 17,085 | 12·1 | 13·0 | 13·5 | 1,470 | 1,585 | 55·3 | 20·1 |
| 3·3 කුඩා සහ අනෙකුත් කර්මාන්ත .. | 2,319 | 1,731 | 1,812 | 2·0 | 1·5 | 1·4 | – 588 | 81 | – 22·1 | 1·0 |
| 4· තැනීම් .. | 8,463 | 8,514 | 8,684 | 7·3 | 7·2 | 6·9 | 51 | 170 | – 1·9 | 2·2 |
| 5· විදුලිය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවා .. | 1,499 | 1,526 | 1,681 | 1·3 | 1·3 | 1·3 | 27 | 155 | 1·0 | 2·0 |
| 6· ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | 13,619 | 13,883 | 14,410 | 11·7 | 11·7 | 11·4 | 264 | 527 | 9·9 | 6·7 |
| 7· තොග සහ සිල්ලර වෙළෙඳාම .. | 25,164 | 25,588 | 26,497 | 21·7 | 21·5 | 20·9 | 424 | 909 | 15·9 | 11·5 |
| 8· බැංකු, රක්ෂණය සහ නිශ්චල දේපල .. | 5,819 | 6,168 | 6,556 | 5·0 | 5·2 | 5·2 | 349 | 388 | 13·1 | 4·9 |
| 9· නිවාස අයිතිය .. | 3,603 | 3,650 | 3,705 | 3·1 | 3·1 | 2·9 | 47 | 55 | 1·8 | 0·7 |
| 10· රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතු .. | 5,462 | 6,140 | 6,340 | 4·7 | 5·2 | 5·0 | 678 | 200 | 25·5 | 2·5 |
| 11· සේවා (අන් තැනක සඳහන් නොවන) .. | 4,423 | 4,530 | 4,955 | 3·8 | 3·8 | 3·9 | 107 | 425 | 4·0 | 5·4 |
| 12· දළ දේශීය නිෂ්පාදිතය .. | 119,050 | 121,729 | 129,256 | 102·4 | 102·4 | 102·0 | 2,679 | 7,527 | 100·7 | 95·6 |
| 13· විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 2,836 | – 2,855 | – 2,509 | – 2·4 | – 2·4 | – 2·0 | – 19 | 346 | – 0·7 | 4·4 |
| 14· දළ ජාතික නිෂ්පාදිතය .. | 116,214 | 118,874 | 126,747 | 100·0 | 100·0 | 100·0 | 2,660 | 7,873 | 100·0 | 100·0 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

වී සහ සුළු ආහාර භෝග උප අංශවලින් කෘෂි අංශයේ වූ පුනර්ජීවනයට කැපී පෙනෙන දයකත්වයක් ලබාදුනි. ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්ක වල පැවැති හිතකර දේශගුණික තත්ත්වයන් කරණකොට 1990 වර්ෂයේදී 1989 වර්ෂයේ වාර්තාගත පහත් වී නිෂ්පාදන මට්ටම අභිබවා සියයට 23 ක වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී. සුළු ආහාර භෝග වල 1990 දී ඇස්තමේන්තු ගත වර්ධනය, 1989 ට වඩා සියයට 8 කි. සුළු ආහාර භෝග, සුළු අපනයන භෝග, කුකුල් හා සත්ත්ව පාලන අංශ වලින් සැදුම්ලත් ' වෙනත් කෘෂිකාර්මික ' උප අංශය ද ඉකුත් වර්ෂයේදී වාර්තාගත සියයට 2 ක වර්ධනය හා සසඳන විට සියයට 7.8 ක් වූ සිත්ගන්නා සුළු වර්ධන වේගයක් පෙන්වීය. එසේ වුවද, නැවත උත්සන්න වූ සිවිල් කලබලකාරි තත්ත්වය හේතුවෙන් උතුරු ප්‍රදේශයේ වෙරළාසන්න ධීවර කර්මාන්තයට බලපෑ බාධා කිරීම් හේතුවෙන් ධීවර අංශයෙහි නිපැයුම් සියයට 5 දක්වා පහත වැටුණි.

මැණික් කර්මාන්තයෙහි වූ පුළුල්වීම හේතුවෙන් පතල් හා කැනීම් අංශයෙහි 1990 වර්ෂයේ දී සියයට 9.1 ක ඇස්තමේන්තුගත වර්ධනයක් ලබාගත හැකි විය. 1989 දී (වි. ගැ. හි.) මිලියන 47.7 ක් වූ මැණික් අපනයන ඉපැයුම් 1990 දී (වි. ගැ. හි. ) මිලියන 53.9 දක්වා වැඩි විය. මේ අතර ඉල්මනයිට්, රුටයිල් සහ අනෙකුත් ඛණිජ වැලි නිමැවුම් පරිමාවෙහි සියයට 26 ක පහත වැටීමක් 1990 වර්ෂයේදී වාර්තා විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ උතුරු හා නැගෙනහිර පතල් කැනීම් කෙරෙන දිස්ත්‍රික්කයන්හි, පැවති සිවිල් කලබලකාරී තත්ත්වය නිසා කැනීම් කටයුතු අඩපණ වීමයි. 1990 වර්ෂයේදී ඉදිකිරීම කටයුතු වල සිදුවූ පුළුල්වීම කැනීම් උප අංශය යථා තත්ත්වයට ගෙන ඒමෙහි සමත් විය.

1986 සිට කාර්මික අංශයෙහි වාසිදයක වර්ධනයක් පෙන්නුම් කළ අතර 1990 දී එය සියයට 9.4 ක් විය. මෙම වර්ධනයට විභවකාරකය වූයේ කාර්මික අපනයනයන්ගේ ඉහළ යාමයි. කාර්මික අංශයෙහි ප්‍රධානම උප අංශය වූ නිෂ්පාදන කර්මාන්ත අංශයෙහි 1990 වර්ෂයේදී එකතු කළ අගයේ වැඩිවීම මූර්ත වශයෙන් සියයට 10.2 ක් විය. 1989 වර්ෂයේදී මෙම අංශයෙහි වර්ධනය සියයට 6 ක්ව පැවතුණි. 1990 වර්ෂයේදී ආහාර, පාන වර්ග හා දුම්කොළ (සියයට 8) රෙදිපිළි, නිමිඇඳුම් හා සම් භාණ්ඩ (සියයට 10) රසායනික ද්‍රව්‍ය, ඛණිජ තෙල් සහ ප්ලාස්ටික් භාණ්ඩ (සියයට 25) සැකසූ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහන උපකරණ (සියයට 12) එකතු කළ අගයන්හි විශාල වැඩිවීමක් පෙන්වූ කාර්මික අංශ අතර විය.

වැවිලි කර්මාන්ත අංශයෙහි 1990 වසරේ සිදුවූ නිෂ්පාදන වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙසින්, තේ, පොල් හා රබර්, කෘෂි සැකසුම් අංශයන්හි ද සියයට 8.4 ක වැඩිවීමක් දක්නට ලැබුණි. 1989 දී මෙම අංශයෙහි සිදුවූ සියයට 0.5 ක පහත වැටීම හා සසඳන විට මෙය සම්පූර්ණයෙන් ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. 1989 වර්ෂයේ වාර්තාගත සියයට 1.9 වූ වර්ධනය හා සසඳන විට 1990 වර්ෂයේදී සුළු කර්මාන්ත උප අංශයෙහි සියයට 6.0 වූ වැඩි වර්ධන වේගයක් අත්කර ගෙන තිබුණි. ආදයම් උත්පාදන රැකියා වැඩි වශයෙන් ඇති කිරීමේ අරමුණින් මෙම අංශය වෙත යොමු කෙරුණු අධික ණය සැපයුම හා ආයතනික වශයෙන් ලැබුණු සහයෝගය මෙයට ඉමහත් සේ ඉවහල් විය.

1989 වර්ෂයේදී සියයට 0.6 ක් පමණ වූ ඉතා අල්ප වර්ධනයක් සටහන් කෙරුනු ඉදිකිරීම් අංශය 1990 වර්ෂයේදී සියයට 2 ක වර්ධනයක් පෙන්නුම් කළේය. රජයේ ආයෝජන වැඩසිළිවෙල සීමා කිරිම හේතුවෙන් රාජ්‍ය අංශයෙහි ඉදිකිරීම් කටයුතු වල සුළු වර්ධන ප්‍රවනතාවක් පෙන්නුම් කළ ද, විමසුමට ලක් කෙරුනු වර්ෂයේ පැවති හිතකර ආයෝජන වාතාවරණය නිසා පෞද්ගලික අංශයෙන් සිදු කෙරුනු වාණිජමය හා නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම් තවදුරටත් පුළුල් විය.

1990 වර්ෂයේදී සේවා අංශය සියයට 4.3 කින් වර්ධනය වූ අතර 89 වර්ෂයේදී එය සියයට 2.2 ක් විය. මෙම වර්ෂය තුළ දළ ජාතික නිෂ්පාදිතයෙහි සිදුවූ පුළුල් වීමට සේවා අංශයෙන් ද සියයට 34 ක දයකත්වයක් ලබාදුනි. 1990 වර්ෂයේදී සේවා අංශය තුළ විදුලිබලය, ගෑස්, ජලය හා සනීපාරක්ෂක සේවාවන්හි සැපයුමේ එකතු කළ අගය සියයට 10.2 කින් වර්ධනය වූ අතර කෘෂි කර්මාන්ත හා කර්මාන්ත අංශවල නිෂ්පාදන වැඩිවීම, වෙළෙඳ හා ගමනාගමන සේවාවන්හි වර්ධනයට මහත් රුකුලක් විය. ඉහළ මට්ටමක පැවති ආර්ථික ක්‍රියාකාරිත්වය 1990 වර්ෂයේදී බැංකු හා මූල්‍යාමය උප අංශවල සාපේක්ෂිත ඉහළ වර්ධන අනුපාතයක් ලබාදීමෙහි සමත් විය. පරිපාලන සහ ව්‍යුහාත්මක වෙනස් කිරීම් සඳහා දරන ලද ප්‍රයත්නයන් හේතුවෙන් 1990 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක සේවාවන්හි වර්ධන වේගයේ අඩුවීමක් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පෙන්නුම් කෙරිණි.

ආරක්ෂක වාතාවරණයෙහි වැඩි දියුණුවත් සමඟ දිගුකලක සිට අපේක්ෂිත බලාපොරොත්තු සඵල කරමින් 1990 වර්ෂයේදී සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වූ අතර සංචාරකයින්ගේ පැමිණීම ඉකුත් වසරට වඩා සියයට 62 කින් ඉහළ නැගුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1989 දී සංචාරක ව්‍යාපාරයෙන් උපයන ලද (වි. ගැ. හි.) මිලියන 59.5 ක්වූ විදේශ විනිමය ප්‍රමාණය 1990 දී (වි. ගැ. හි.) මිලියන 88.0 දක්වා වැඩි වූ අතර හෝටල් සේවාවන්හි එකතු කළ අගය මූර්ත වශයෙන් සළකන විට සියයට 20 කින් වැඩි විය. හෝටල් උප සේවාවන්හි සිදුවූ පුළුල් වීම ' අනෙකුත් සේවා ' අංශයෙහි වර්ධනයට මහත් රුකුලක් විය.

**වියදම**

1990 දී වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 346 ක් වූ අතර පසුගිය වසර හා සසඳන විට එය සියයට 25.5 ක වැඩිවීමකි. පෞද්ගලික හා රජයේ පරිභෝජනය 1989 දී රුපියල් බිලියන 221 ක් වූ අතර, 1990 දී රුපියල් බිලියන 274 දක්වා ඉහළ ගියේය. 1990 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය රුපියල් බිලියන 73 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 1989 වර්ෂය සමඟ සංසන්දනය කිරීමේදී සියයට 33 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

පෞද්ගලික පරිභෝජන වියදම සියයට 24.8 කින් වැඩි වූ බව ඇස්තමේන්තු කර ඇති අතර, එය 1989 දී රුපියල් බිලියන 195 ක්ද, 1990 දී රුපියල් බිලියන 243 ක් ද විය. 1989 දී සියයට 21 ක් වූ පෞද්ගලික පරිභෝජනයේ, උප අංශයක් වූ ආනයන පරිභෝජන භාණ්ඩ හා සේවා 1990 දී සියයට 26 ක් විය. ආනයනික ආහාර සහ පාන වර්ග වල වැඩිවීමේ වේගය පහත වැටීමට හේතු වූයේ 1990 වසරේදී දේශීය කෘෂි නිමැවුම් වර්ධනය හේතුවෙන් ආනයන අඩුවීමයි. මේ අතර 1990 දී පෞද්ගලික පරිභෝජන වියදමෙහි අන්තර්ගත වන සුඛෝපභෝගී පරිභෝජන භාණ්ඩ වන මෝටර් වාහන හා මෝටර් සයිකල් යනාදිය සඳහා වියදම සැළකිය යුතු මට්ටමක පවතී. 1990 දී රජයේ පරිභෝජන වියදම සියයට 16 කින් වර්ධනය වූ අතර ඊට ප්‍රධාන වශයෙන් බලපෑවේ රජයේ ආරක්ෂක වියදමෙහි වූ වර්ධනයයි.

තොග වෙනස්වීම් ද ඇතුළුව පවත්නා වෙළෙඳ මිළ අනුව දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1990 දී සියයට 33 කින් වර්ධනය වූ අතර 1989 දී එහි වර්ධනය සියයට 8 ක් විය. රජයේ සංස්ථා හා පෞද්ගලික අංශයෙහි ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය සියයට 32 කින් ඉහළ ගිය අතර එම වර්ධනය 1989 දී සියයට 16 ක් විය. කෙසේ වුවද, 1990 දී රජයේ ප්‍රාග්ධන සම්පාදනයෙහි සියයට 5 ක අඩුවීමක් දක්නට ලැබේ.

**සම්පත් හා සම්පත් උපයෝජනය**

1990 දී ශ්‍රී ලංකා ආර්ථිකය සතුව පැවති සම්පත් හා සම්පත් උපයෝජනය 1.7 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. 1990 දී මුළු සම්පත් ප්‍රමාණය රුපියල් බිලියන 443.6 ක් වූ අතර 1989 වසර සමඟ සැසඳීමේදී එය රුපියල් බිලියන 344.5 ක් විය. මුළු සම්පත් ප්‍රමාණය වැඩිවීම කෙරෙහි දළ දේශීය නිෂ්පාදිතයේ රුපියල් බිලියන 69 ක වැඩිවීම සහ ආනයනික භාණ්ඩ හා සාධක නොවන සේවාවන්හි රුපියල් බිලියන 30 ක වැඩිවීම් ද බලපා ඇත. මුළු සම්පත් වලින් සියයට 62 ක් පරිභෝජනයට ද, සියයට 16 ක් ප්‍රාග්ධන සම්පාදනයට සහ සියයට 22 ක් අපනයන භාණ්ඩ හා සේවා සඳහා ද උපයෝජනය කොට ඇත.

## 1.7 සංඛ්‍යා සටහන

## සම්පත් සංයුතිය හා උපයෝගී කරගත් ආකාරය 1982 – 1990

| ශීර්ෂය | පවත්නා වෙළෙඳ මිළ අනුව (රු. දශ ලක්ෂ) | | | | 1982 මිළ අනුව | | | | | | | | ප්‍රතිශතක වර්ධනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1988* | 1989* | 1990* | 1982 | | 1988* | | 1989* | | 1990* | | 1988 ට වඩා 1989 | 1989 ට වඩා 1990 |
| | | | | | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | වටිනාකම රු. දශ ලක්ෂ | % | | |
| 1. මුළු සම්පත් .. | 145,143 | 303,753 | 344,478 | 443,612 | 145,143 | 100 | 180,300 | 100 | 182,062 | 100 | 188,895 | 100 | 1·0 | 3·8 |
| 1.1 වෙළෙඳ මිළ අනුව ද.දේ.නි. .. | 99,238 | 221,982 | 251,891 | 321,057 | 99,238 | 68 | 124,864 | 69 | 127,735 | 70 | 135,655 | 72 | 2·3 | 6·2 |
| 1.2 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 45,905 | 81,771 | 92,587 | 122,555 | 45,905 | 32 | 55,436 | 31 | 54,327 | 30 | 53,240 | 28 | – 2·0 | – 2·0 |
| 2. උපයෝගීකරණය .. | 145,143 | 303,753 | 344,478 | 443,612 | 145,143 | 100 | 180,300 | 100 | 182,062 | 100 | 188,895 | 100 | 1·0 | 3·8 |
| 2.1 පරිභෝජනය .. | 87,468 | 195,306 | 221,090 | 273,640 | 87,468 | 60 | 112,273 | 62 | 114,001 | 63 | 116,419 | 62 | 1·5 | 2·1 |
| 2.2 ස්ථාවර දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 30,279 | 49,961 | 54,249 | 71,600 | 30,279 | 21 | 33,556 | 18 | 31,408 | 17 | 31,879 | 17 | – 7·4 | 1·5 |
| 2.2.1 රජය .. | (4,866) | (12,805) | (14,306) | (13,480) | (4,866) | (3) | (7,208) | (4) | (6,910) | (4) | (5,597) | (3) | – 4·0 | – 19·0 |
| 2.2.2 රජයේ සංස්ථා සහ සංයුක්ත මණ්ඩල .. | | | | | | | | | | | | | | |
| 2.2.3 පෞද්ගලික අංශය .. | (25,413) | (37,156) | (39,943) | (58,120) | (25,413) | (18) | (26,348) | (14) | (24,498) | (13) | (26,280) | (14) | – 7·0 | 7·3 |
| 2.3 තොග වෙනස්වීම් .. | 248 | 601 | 473 | 1,038 | 248 | — | 300 | — | 196 | — | 240 | — | — | — |
| 2.4 භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 27,148 | 57,885 | 68,666 | 97,334 | 27,148 | 19 | 34,171 | 19 | 36,457 | 20 | 40,357 | 21 | 6·7 | 11·1 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1982 ස්ථාවර සාධක මිළ අනුව මුළු සම්පත්, 1990 දී සියයට 3.8 කින් වැඩි වී ඇති අතර, පෙර වසර සමඟ සැසඳීමේදී එහි ආන්තික වැඩිවීම සියයට 1.0 කි.

මූර්ත වශයෙන් ගත් කල පෞද්ගලික පරිභෝජන වියදම 1990 දී සියයට 2.7 කින් වැඩි වී ඇති අතර, එය 1989 දී වැඩි වූයේ සියයට 1.0 කිනි. 1989 දී මූර්ත වශයෙන් සියයට 9 කින් ඉහළ ගිය රජයේ පරිභෝජන වියදම, 1990 දී ආන්තික වශයෙන් අඩුවීමක් වාර්තා කළේය.

1988 හා 1989 යන වසර වලදී මූර්ත වශයෙන් අඩු වූ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1990 දී සියයට 1.5 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 1990 මෙම වර්ධනය සඳහා පෞද්ගලික අංශය මගින් කරන ලද ඉදිකිරීම් ක්‍රියාකාරකම් වල ප්‍රසාරණය සහ යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන උපකරණ වල ආයෝජන ඉහළ යෑම, බලපා ඇත.

පසුගිය කාලය තුළදීද සැහෙන වර්ධන අනුපාතයක් පවත්වාගෙන ගිය අපනයන අංශය, 1990 දී ද එම වේගය එලෙසම පවත්වා ගනිමින් මූර්ත වශයෙන් සියයට 11 ක වර්ධන වේගයක් ලබාගෙන තිබේ. කෘෂි හා කාර්මික අපනයන යන දෙඅංශයෙහිම සිදුවූ ප්‍රසාරණය අපනයන අංශයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය.

1989 දී දේශීය ඉතුරුම් රුපියල් බිලියන 30.8 සිට 1990 දී රුපියල් බිලියන 47.4 දක්වා ඉහළ ගියේය. දේශීය ඉතුරුම් වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල 1989 දී සියයට 12.2 ක සිට 1990 දී සියයට 14.8 දක්වා ඉහළ ගියේය. විදේශීය ශුද්ධ සාධක ආදයම හා විදේශීය පෞද්ගලික ප්‍රේෂණයන් ඇතුළත් ජාතික ඉතුරුම් 1990 දී සියයට 52 කින් වැඩි වී ඇත.

### 1.8 සංඛ්‍යා සටහන

### ජාතික ඉතුරුම් 1988 – 1990 (පවත්නා වෙළෙඳ මිළ අනුව)

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1988* | 1989* | 1990* |
|---|---|---|---|
| 1. වෙළෙඳ මිළ අනුව දළ දේශීය නිෂ්පාදිතය .. | 221,982 | 251,891 | 321,057 |
| 2. දේශීය ඉතුරුම් .. | 26,676 | 30,801 | 47,417 |
| 3. විදේශීය ශුද්ධ සාධක ආදයම .. | – 5,266 | – 5,738 | – 5,942 |
| 4. විදේශීය ශුද්ධ පෞද්ගලික පැවරුම් .. | 10,187 | 11,840 | 14,813 |
| 5. ජාතික ඉතුරුම් .. | 31,597 | 36,903 | 56,288 |
| 6. දේශීය ඉතුරුම් අනුපාතිකය (අංක 2 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 12·0 | 12·2 | 14·8 |
| 7. ජාතික ඉතුරුම් අනුපාතිකය (අංක 5 අංක 1 හි ප්‍රතිශතයක් ලෙස) | 14·2 | 14·6 | 14·5 |

* තාවකාලිකයි.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.